

# බුදුසරණ

## 2014 පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් විය යුතු දවස්

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| උඳුවප් මස පෝය - 2013 | | | | | | | | | | |
| දෙසැ. 31 | අඟහ. | අ.භා. | 08.29 න් | අමාවක ලබා 2014 ජන. | 01 බදාදා . | අ.භා | 04.44 න් | ගෙවේ. | 01 | බදාදා . සිල් |
| දුරුතු මස පෝය | | | | | | | | | | |
| ජන 07 | අඟහ. | අ.භා. | 09.26 න් | පුර අටවක ලබා | 08 බදාදා | අ.භා. | 09.17 න් | ගෙවේ. | 08 | බදාදා. සිල් |
| ජන. 15 | බදාදා | පූ.භා. | 07.52 න් | පුර පසළොස්වක ලබා | 16 බ්‍රහස්. | පූ.භා. | 10.23 න් | ගෙවේ. | 15 | බදාදා. සිල් |
| ජන 23 | බ්‍රහස්. | අ.භා. | 10.46 න් | අව අටවක ලබා | 24 සිකුරා. | අ.භා. | 10.33 න් | ගෙවේ. | 24 | සිකුරාදා. සිල් |
| ජන. 30 | බ්‍රහස්. | පූ.භා. | 07.03 න් | අමාවක ලබා | 31 සිකුරා. | පූ.භා. | 03.10 න් | ගෙවේ. | 30 | බ්‍රහස්. සිල් |
| නවම් මස පෝය | | | | | | | | | | |
| පෙබ. 06 | බ්‍රහස්. | අ.භා. | 12.35 න් | පුර අටවක ලබා | 07 සිකුරා. | අ.භා. | 01.31 න් | ගෙවේ. | 06 | බ්‍රහස්. සිල් |
| පෙබ. 14 | සිකුරා. | පූ.භා. | 03.10 න් | පුර පසළොස්වක ලබා | 15 සෙන. | පූ.භා. | 05.24 න් | ගෙවේ. | 14 | සිකුරා. සිල් |
| පෙබ. 22 | සෙන. | පූ.භා. | 11.15 න් | අව අටවක ලබා | 23 ඉරිදා | පූ.භා. | 10.02 න් | ගෙවේ. | 22 | සෙන. සිල් |
| පෙබ. 28 | සිකුරා. | අ.භා. | 04.53 න් | අමාවක ලබා මාර්තු | 01 සෙන. | අ.භා. | 01.34 න් | ගෙවේ. | 28 | සිකුරාදා. සිල් |
| මැදින් මස පෝය | | | | | | | | | | |
| මාර්. 08 | සෙන. | පූ.භා. | 06.07 න් | පුර අටවක ලබා | 09 ඉරිදා | පූ.භා. | 07.58 න් | ගෙවේ. | 08 | සෙන. සිල් |
| මාර්. 15 | සෙන. | අ.භා. | 09.19 න් | පුර පසළොස්වක ලබා | 16 ඉරිදා | අ.භා. | 10.37 න් | ගෙවේ. | 16 | ඉරිදා.සිල් |
| මාර්. 23 | ඉරිදා. | අ.භා. | 08.10 න් | අව අටවක ලබා | 24 සඳුදා | අ.භා. | 06.13 න් | ගෙවේ. | 24 | සඳුදා. සිල් |
| මාර්. 30 | ඉරිදා. | පූ.භා. | 02.33 න් | අමාවක ලබා | 31 සඳුදා | පූ.භා. | 00.18 න් | ගෙවේ. | 30 | ඉරිදා. සිල් |
| බක් මස පෝය | | | | | | | | | | |
| අප්‍රේ. 07 | සඳුදා | පූ.භා. | 00.56 න් | පුර අටවක ලබා | 08 අඟහ. | පූ.භා. | 03.13 න් | ගෙවේ. | 07 | සඳුදා. සිල් |
| අප්‍රේ. 14 | සඳුදා. | අ.භා. | 01.11 න් | පුර පසළොස්වක ලබා | 15 අඟහ. | අ.භා. | 01.10 න් | ගෙවේ. | 14 | සඳුදා. සිල් |
| අප්‍රේ. 22 | අඟහ. | පූ.භා. | 02.30 න් | අව අටවක ලබා | 23 බදාදා | පූ.භා. | 00.14 න් | ගෙවේ. | 22 | අඟහ. සිල් |
| අප්‍රේ. 28 | සඳුදා | අ.භා. | 12.44 න් | අමාවක ලබා | 29 අඟහ. | පූ.භා | 11.49 න් | ගෙවේ. | 28 | සඳුදා. සිල් |
| වෙසක් මස පෝය | | | | | | | | | | |
| මැයි 06 | අඟහ. | අ.භා. | 07.34 න් | පුර අටවක ලබා | 07 බදාදා | අ.භා. | 09.55 න් | ගෙවේ. | 07 | බදාදා.සිල් |
| මැයි 14 | බදාදා | පූ.භා. | 02.14 න් | පුර පසළොස්වක ලබා | 15 බ්‍රහස්. | පූ.භා. | 00.44 න් | ගෙවේ. | 14 | බදාදා.සිල් |
| මැයි 21 | බදාදා. | පූ.භා. | 07.37 න් | අව අටවක ලබා | 22 බ්‍රහස් | පූ.භා. | 05.29 න් | ගෙවේ. | 21 | බදාදා. සිල් |
| මැයි 27 | අඟහ. | අ.භා. | 11.50 න් | අමාවක ලබා | 29 බ්‍රහස්. | පූ.භා. | 00.13 න් | ගෙවේ. | 28 | බදාදා. සිල් |
| පොසොන් මස පෝය | | | | | | | | | | |
| ජූනි 05 | බ්‍රහස්. | අ.භා. | 01.06 න් | පුර අටවක ලබා | 06 සිකුරා. | අ.භා. | 03.02 න් | ගෙවේ. | 05 | බ්‍රහස්. සිල් |
| ජූනි 12 | බ්‍රහස්. | අ.භා. | 12.25 න් | පුර පසළොස්වක ලබා | 13 සිකුරා. | පූ.භා. | 09.41 න් | ගෙවේ. | 12 | බ්‍රහස්. සිල් |
| ජූනි 19 | බ්‍රහස්. | අ.භා. | 01.06 න් | අව අටවක ලබා | 20 සිකුරා. | පූ.භා. | 11.29 න් | ගෙවේ. | 19 | බ්‍රහස්.සිල් |
| ජූනි 26 | බ්‍රහස්. | අ.භා. | 12.11 න් | අමාවක ලබා | 27 සිකුරා. | අ.භා. | 01.41 න් | ගෙවේ. | 26 | බ්‍රහස්. සිල් |
| ඇසළ මස පෝය | | | | | | | | | | |
| ජූලි 05 | සෙන. | පූ.භා. | 04.49 න් | පුර අටවක ලබා | 06 ඉරිදා | පූ.භා. | 05.59 න් | ගෙවේ. | 05 | සෙන. සිල් |
| ජූලි 11 | සිකුරා. | අ.භා. | 08.31 න් | පුර පසළොස්වක ලබා | 12 සෙන. | අ.භා. | 04.54 න් | ගෙවේ. | 12 | සෙන. සිල් |
| ජූලි 18 | සිකුරා. | අ.භා. | 08.13 න් | අව අටවක ලබා | 19 සෙන | අ.භා. | 07.26 න් | ගෙවේ. | 19 | සෙන. සිල් |
| ජූලි 26 | සෙන. | පූ.භා. | 01.59 න් | අමාවක ලබා | 27 ඉරිදා | පූ.භා. | 04.13 න් | ගෙවේ. | 26 | සෙන. සිල් |
| නිකිණි මස පෝය | | | | | | | | | | |
| අගෝ. 03 | ඉරිදා | අ.භා. | 06.06 න් | පුර අටවක ලබා | 04 සඳුදා | අ.භා. | 06.12 න් | ගෙවේ. | 04 | සඳුදා. සිල් |
| අගෝ. 10 | ඉරිදා | පූ.භා. | 03.37 න් | පුර පසළොස්වක ලබා | එදිනම | අ.භා. | 11.40 න් | ගෙවේ. | 10 | ඉරිදා. සිල් |
| අගෝ. 17 | ඉරිදා | පූ.භා. | 05.58 න් | අව අටවක ලබා | 18 සඳුදා | පූ.භා. | 06.08 න් | ගෙවේ. | 17 | ඉරිදා. සිල් |
| අගෝ. 24 | ඉරිදා | අ.භා. | 05.17 න් | අමාවක ලබා | 25 සඳුදා | අ.භා. | 07.43 න් | ගෙවේ. | 28 | ඉරිදා. සිල් |
| බිනර මස පෝය | | | | | | | | | | |
| සැප්. 02 | අඟහ. | පූ.භා. | 05.04 න් | පුර අටවක ලබා | 03 බදාදා | පූ.භා. | 04.08 න් | ගෙවේ. | 02 | අඟහ. සිල් |
| සැප්. 08 | සඳුදා | පූ.භා. | 10.50 න් | පුර පසළොස්වක ලබා | 09 අඟහ. | පූ.භා. | 07.10 න් | ගෙවේ. | 08 | සඳුදා. සිල් |
| සැප්. 15 | සඳුදා | අ.භා. | 07.12 න් | අව අටවක ලබා | 16 අඟහ. | අ.භා. | 08.19 න් | ගෙවේ. | 16 | අඟහ. සිල් |
| සැප්. 23 | අඟහ. | පූ.භා. | 09.45 න් | අමාවක ලබා | 24 බදාදා. | පූ.භා. | 11.43 න් | ගෙවේ. | 23 | අඟහ. සිල් |
| වප් මස පෝය | | | | | | | | | | |
| ඔක් 01 | බදාදා. | අ.භා. | 01.47 න් | පුර අටවක ලබා | 02 බ්‍රහස්. | අ.භා. | 12.06 න් | ගෙවේ. | 01 | බදාදා. සිල් |
| ඔක්.07 | අඟහ. | අ.භා. | 07.17 න් | පුර පසළොස්වක ලබා | 08 බදාදා | අ.භා. | 04.25 න් | ගෙවේ. | 08 | බදාදා.සිල් |
| ඔක්. 15 | බදාදා. | පූ.භා. | 11.49 න් | අව අටවක ලබා | 16 බ්‍රහස්. | පූ.භා. | 01.49 න් | ගෙවේ. | 15 | බදාදා. සිල් |
| ඔක්. 23 | බ්‍රහස්. | පූ.භා. | 02.35 න් | අමාවක ලබා | 24 සිකුරා. | පූ.භා. | 03.27 න් | ගෙවේ. | 23 | බ්‍රහස්. සිල් |
| ඉල් මස පෝය | | | | | | | | | | |
| ඔක්. 30 | බ්‍රහස්. | අ.භා. | 09.18 න් | පුර අටවක ලබා | 31 සිකුරා. | අ.භා. | 07.14 න් | ගෙවේ. | 31 | සිකුරා. සිල් |
| නොවැ. 06 | බ්‍රහස්. | පූ.භා. | 05.37 න් | පුර පසළොස්වක ලබා | 07 සිකුරා. | පූ.භා. | 03.55 න් | ගෙවේ. | 06 | බ්‍රහස්. සිල් |
| නොවැ. 14 | සිකුරා. | පූ.භා. | 07.32 න් | අව අටවක ලබා | 15 සෙන. | පූ.භා. | 10.04 න් | ගෙවේ. | 14 | සිකුරා. සිල් |
| නොවැ. 21 | සිකුරා. | අ.භා. | 06.39 න් | අමාවක ලබා | 22 සෙන. | අ .භා. | 05.59 න් | ගෙවේ. | 22 | සෙන. සිල් |
| උඳුවප් මස පෝය | | | | | | | | | | |
| නොවැ. 29 | සෙන. | පූ.භා. | 04.39 න් | පුර අටවක ලබා | 30 ඉරිදා. | පූ.භා. | 02.38 න් | ගෙවේ. | 29 | සෙන. සිල් |
| දෙසැ. 05 | සිකුරා. | අ.භා. | 06.23 න් | පුර පසළොස්වක ලබා | 06 සෙන. | අ.භා. | 06.01 න් | ගෙවේ. | 06 | සෙන. සිල් |
| දෙසැ. 14 | ඉරිදා | පූ.භා. | 05.04 න් | අවඅටවක ලබා | 15 සඳුදා | පූ.භා. | 07.34 න් | ගෙවේ. | 14 | ඉරිදා. සිල් |
| දෙසැ. 21 | ඉරිදා | පූ.භා. | 09.15 න් | අමාවක ලබා | 22 සඳුදා | පූ.භා. | 07.06 න් | ගෙවේ. | 21 | ඉරිදා. සිල් |
| දුරුතු මස පෝය - | | | | | | | | | | |
| දෙසැ.28 | ඉරිදා | අ.භා. | 12.57 න් | පුර අටවක ලබා | 29 සඳුදා | පූ.භා. | 11.19 න් | ගෙවේ. | 28 | ඉරිදා සිල්. |

### දෙළොස් මහා පොහොය දිනවල සිදුවූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

**දුරුතු පසළොස්වක පොහොය**
තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ ඓතිහාසික දුරුතු පෝ දිනකය. තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සච්චන් සදහම් මගට හරවා ඔවුන් හැම අරි සග ගණ බවට පත්කොට වදාළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළදිව බිම් තැන්නේ මහ-වැලි ගඟ අසබඩ මිතිපේ නම් සරුදනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදුරැස් මාලාවන්-ගෙන් දිලිහී වැඩහුන් සේක.

**නවම් පසළොස්වක පොහොය**
සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදුවූයේ ද නවම් පුනු පොහෝ දිනකය.

**මැදින් පසළොස්වක පොහොය**
ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත් පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදකය.

**බක් පසළොස්වක පොහොය**
බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි බක් පොහොය දිනය. මේ සුන්දර දිවයින තෙවැනි වරට ද බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා නිවී සැනසී ගියේ ද, බක් පුර පොහෝ දිනකදී ය.

**වෙසක් පසළොස්වක පොහොය**
තිලොවග සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අසි-රිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනයයි.

**පොසොන් පසළොස්වක පොහොය**
අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සදහම් පණිවිඩය රැගෙන වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් දිනයයි.

### දෙළොස් මහා පොහොය දිනවල සිදුවූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

**ඇසළ පසළොස්වක පොහොය.**
බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත් නිවනත් එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දින-යයි, ඇසළ පෝද.

**නිකිණි පසළොස්වක පොහොය**
ඇසළ අව පැළවිය ද භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයයි. නිකිණි පසළොස්වක පොහෝද පොහොය කොට නිකිණි අව පැළවිය ද පසුවස් එළඹීමයි සසුන් පිළිවෙත වන්නේ.

**බිනර පසළොස්වක පොහොය**
බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරා-මයන්හි නිබඳව වැඩ වසමින් බණ භාවනාවල යෙදෙමින් ස්වකීය ශාසන පරමාර්ථ ඉටු කර-ගන්නා කාලයකි. මෙහෙණි සසුණේ ආරම්භය සිදු විය.

**වප් පසළොස්වක පොහොය**
වස්සාන ඍතුවේ මුල් තුන් මස භික්ෂූන් වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි. එය චීවර මාසය නමින් ද ව්‍යවහාර කැරේ.

**ඉල් පසළොස්වක පොහොය**
ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කීපය-කට මුල් වූ පොහොය දිනයකි. මෛත්‍රී බෝසත්-තුමා විවරණය ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම පසුවස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහ රහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීම ද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝද ය.

**උඳුවප් පසළොස්වක පොහොය**
උඳුවප් පොහොය දින සිදු වූ ශ්‍රී සංඝමිත්තා මහ-රහත් මෙහෙණින් වහන්සේගේ ලංකා ගමනය ගැන ලංකා මෙහෙණි සසුන ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන සිහි කරන කවර අයකුට වුවද ඇති වනුයේ මහා සැනසිල්ලකි.





වර්ෂ 2014 ක්වූ ජනවාරි 01 වනදා බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.